සන්නස SANNASA

## ලියා දක්වන වග

**ලංකාවේ එක් එක් ක්ෂේත්‍රයන්හි සිටින ප්‍රවීණයින් සමඟ කෙරෙන සුහද සාකච්ඡාවක් අද සිට ආලින්දය නැමැති පිටුවෙන් ඔබ වෙත ගෙන ඒමට බලාපොරොත්තු වෙමු . නොයෙකුත් ප්‍රශ්න කෙරේ එතුමන්ලා දක්වන නවතම ආකල්ප ඔබට මින් දැනගන්නට හැකිවනවා ඇත. අද දින මේ සාකච්ඡාවට අවස්ථාව ලබා දුන්නේ ලංකාවේ පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාය.**

**ඉදිරි කලාපවලදී ලංකාවේ ආගමික , දේශපාලන, වෛද්‍ය , කෘෂිකර්ම ,සංගීත, නාට්‍ය, ජෝතිෂ්‍ය, ලේඛන ක්ෂේත්‍රයන්හි රටේ නමගිය විද්වතුන් ආලින්දයට කැඳවාගෙන එන්නෙමු.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක **/ Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

## පන්හිඳයි පින්සලයි



**සිසිර දිසානායක**

# මැරි-නොමැරි ඇනිවසරි

"හලෝ සුමනලතා..... ! කාලෙකින්.... !! "

පන්හිඳට සුමනලතා දුම්රියපළේ දී මුණ ගැහුණේ අවුරුදු හතළිහකට විතර පස්සේ.

"සුමනා... සුමනා.... not සුමනලතා...."

සුමනා මිහිරි විදියට හිනා වුණා.

"දන් නැද්ද ඉතින් ? කෙටියට.... පහ සුවට..."

"කොහොමද ඉතින් ? " අඳුනාගන්නත් බැරි තරම්....

"ඒක තමා ඒත් ඉතින් ඒ කාලේ විදියම තමයි තවමත්... පන් දුරින් එන කෝච්චියට නගින්න වේදිකාව දිහාවට ගියේ සුමනාත් එක්කමයි."

"city එකටද වැඩට යන්නේ ? " සුමනා ඇහුවේ දුම්රියේ වාඩි වෙන ගමන්.

"ඔව් කයියක් ගහගෙන යමු.."

"කාලය යන ඉක්මන.... ?" පන් මුල පිරුවා

"ඔව් අනේ අපි marry කරලත් දැන් විසි පහක් වුණා. ළමයි තුන් දෙනා එකතු වෙලා දුන්නා මාර surprise එකක්... !"

සුමනා තමන්ගේ පවුලේ තොරතුරු පරණ පන්ති මිත්‍රයාට කිව්වේ බොහෝම උනන්දුවෙන්.

"අපි ඉතින් Love කළා. Marry කළා. දරුවෝ හැදුවා. දැන් අපි ළමයි බවට පත් වෙන කාලේ. අපට ළමයි තවම පුංචි අය වුණාට උන් දැන් වැඩිහිටියෝ. අපිටත් වඩා ලෝකෙ ගැන දන්නවා. තව ටික දවසකින් වෙන්නේ උන් කියන හැටියකට ඉන්න තමයි..." සුමනා තමන්ගේ ජීවන අත්දැකීම සාරාංශ කළා. හොඳ වෙලාවට සුමනාට පන් ගැන යමක් අහන්න තරම් ඉස්පාසුවක් තිබුණේ නැහැ. ඇහුවනම් පන්ට මො නවද කියන්න තියෙන්නේ ?

"අවිවාහකයි , දරුවෝ නැහැ...."

"ඇයි ඒ ...? "
"පරණ කතාවක් තිබුණා. ඒක මඟ හැරුණා."
සුමනාට සිරියාවතීගේ හුටපටය මතක නෑ වගේ හොඳ වෙලාවට. අධි වේගී කෝච්චියක් පන්ලා ඉන්න කෝච්චිය පහු කරගෙන ගියා අනෙක් රේල් පාරෙන්.

"සිරියාත් ඒ වාගේ..."

පන්ට හිතුනා. අති ධාවනකාරියි. පන්ට ඒ විදියට හැල්මේ දුවන්න ඕනකමක් තිබුණේ නැහැ.

"ඔයාට මතකද අර අපේ පන්තියේ උන්නු සිරියලතා... ? පන් සුමනාගෙන් ඇහුවේ සිරියා ගැන හෝඩුවාවක් දැනගන්න."

"මොකද නැත්තේ ? ඔයාගේ පරණ Love එක"

සුමනාට නම් හිනා.

"එයා හරි Fast. ඔයාවත් මඟ හැරලා එල්ලුනේ ඊටත් හපන් කෙනෙක්ගේ. ඒ ගිය හැටියට දැන් උන් ඇත්තේ අඟහරු දිහාවෙ." සුමනා ආයෙමත් කැකිරි පලනවා.
දුම්රිය මැදිරියම හෙල්ලෙන්න.
ඒත් පන් තවම තනියම

"ඔයා තනිකඩ උනේ සිරියා හන්ද ද?" සුමනා අහන්නේ උත්තරයක් දෙන්න බැරි ප්‍රශ්ණයක්.

18 වන පිටට